# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 38 දරන
# පෞද්ගලික බස් රථ සේවා
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 සැප්තැම්බර් මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 සැප්තැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: රු. 1.80 යි        තැපැල් ගාස්තුව: ශත 90 යි

## 1985 අංක 38 දරන පෞද්ගලික බස් රථ සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 සැප්තැම්බර් මස 10 වන දින.]

එල්. ඞී.—ඕ. 1/85.

**පෞද්ගලික බස් රථ සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1985 අංක 38 දරන පෞද්ගලික බස් රථ සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ :— ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1983 අංක 44 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ;

(2) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

> "(2) කිසිදු තැනැත්තකු විසින් ගාස්තුවක් හෝ ත්‍යාගයක් මත මගීන් ප්‍රවාහනය පිණිස නිත්‍ය සේවා වක කාර්යය සඳහා, මේ උපවගන්තිය ක්‍රියාත්මක වන දිනයේ දී හෝ ඉන් පසුව, බස් රථයක් නොවන යම් වාහනයක් පාවිච්චි නොකළ යුතු ය.".

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

> "(3) මේ වගන්තියේ විධිවිධාන කඩ කර මින් පාවිච්චි කරනු ලබන යම් වාහනයක්, 2 (3) වන වගන්තිය යටතේ බලය පවරන ලද යම් නිලධරයකු විසින් හෝ යම් පොලිස් නිලධරයකු විසින් තහනමට ගැනීම කළ හැකි අතර එම වාහනය තහනමට ගනු ලැබුවේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒ නිලධරයා හෝ පොලිස් නිලධරයා විසින් එය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.
>
> (4) (3) වන උපවගන්තියේ විධිවිධාන යටතේ, යම් වාහනයක් මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, නඩු විභාගය අවසන් වන තෙක් එකී වාහනය රඳවා තබා ගන්නා ලෙස ආඥාවක් හෝ නඩුවේ අවස්ථාගත කරුණු අනුව මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව එකී වාහනය මුදා හරින ලෙස ආඥාවක්, මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි ය.".

1—ඒ 085152—8,200 (85/08)

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට, පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"විධාන නිකුත් කිරීමට, බස්රථ ධාවන අවසර පත්‍ර පරීක්ෂා කිරීමට සහ ලේඛන ආදිය අත් අඩංගුවට ගැනීමට අධ්‍යක්ෂවරයාට ඇති බලය.". තව ද,

(3) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) අධ්‍යක්ෂවරයා විසින් හෝ 2 (3) වන වගන්තිය යටතේ ඔහු විසින් යථා පරිදි බලය පවරන ලද යම් නිලධරයකු විසින් කවර හෝ අවස්ථාවක—

(අ) මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලට හෝ ඒ යටතේ නිකුත් කරන ලද විධානවලට අනුකූලව කටයුතු කරනු ලබන්නේ ද යන වග නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා, මගීන් ප්‍රවාහනය කිරීම පිණිස පාවිච්චි කරනු ලබන යම් බස් රථයකට ඇතුළු වීම ;

(ආ) බස් රථය සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද බස්රථ ධාවන අවසර පත්‍රය හෝ වෙනත් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස ඒ බස් රථයේ රියදුරාට නියම කිරීම ;

(ඇ) ඒ බස්රථ ධාවන අවසර පත්‍රය හෝ වෙනත් ලේඛනය හෝ එහි පිටපත තම භාරයට ගැනීම

කරනු ලැබිය හැකි ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) නියමිත දිනට පසු හැකිතාක් ඉක්මණින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්—

(අ) එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා (මෙහි මින් මතු "දිස්ත්‍රික්ක සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිස්ත්‍රික්ක පෞද්ගලික බස් රථ ධාවකයන් ගේ සමිතියක් හෝ යම් පරිපාලන දිස්ත්‍රික්කයක නිත්‍ය සේවා ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා නිකුත් කරන ලද බස් රථ ධාවන අවසර පත්‍ර සංඛ්‍යාවෙන් නියෝජනය වන බස් රථ සංඛ්‍යාව එක් දහසක් ඉක්මවන අවස්ථාවක, ඒ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත දිස්ත්‍රික්ක සමිති එකක් හෝ ඊට වැඩි ගණනක් පිහිටුවීම ; සහ

(ආ) එසේ පිහිටුවනු ලැබූ එක් එක් දිස්ත්‍රික්ක සමිතියට නාමක් පැවරීම සහ එහි බල සීමාව නියම කිරීම

කළ යුතු ය.";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ බස් රථ ධාවන අවසර පත්‍රයක් දරන, (මෙහි මින් මතු "පෞද්ගලික බස් රථ ධාවකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම තැනැත්තකුම, බස් රථ ධාවන අවසර පත්‍රයෙහි සඳහන් මාර්ගයේ ආරම්භක ස්ථානය පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක ද ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික්ක සමිතියේ සාමාජිකයකු විය යුතු අතර, එක් පරිපාලන දිස්ත්‍රික්කයක දිස්ත්‍රික්ක සමිති එකකට වැඩි ගණනක් ඇති අවස්ථාවක, බස්රථ ධාවන අවසර පත්‍රයෙහි

සඳහන් මාර්ගයේ ආරම්භක ස්ථානය පිහිටා තිබෙන්නේ යම් දිස්ත්‍රික්ක සමිතියක බල ප්‍රදේශය ඇතුළත ද ඒ දිස්ත්‍රික්ක සමිතියේ සාමාජිකයකු විය යුතු ය.''; තව ද

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4) දිස්ත්‍රික්ක සමිතියක් විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහිලා පවත්වා ගෙන යනු ලබන යම් ලේඛනයකින් හෝ වාර්තා පොතකින් ලබා ගන්නා ලද හා ඒ දිස්ත්‍රික්ක සමිතියේ ලේකම් විසින් සත්‍ය උධෘතයක් හෝ පිටපතක් වශයෙන් සහතික කරන ලද උධෘතයක් හෝ පිටපතක් යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඔප්පු කිරීමකින් තොරව සාක්ෂ්‍යයේ දී ආවේශ්‍ය කරගනු ලැබිය යුතු අතර, ඒ විස්තර ලේඛනයේ හෝ වාර්තා පොතේ ඇතුළත් කරුණු පිළිබඳව එය මූල් බැල්මට පෙනෙන සාක්ෂිය විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 20අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"සාමාජිකයන් ආදිය පිළිබඳ ලේඛනයක් අධ්‍යක්ෂ වරයා විසින් පවත්වා ගෙන යා යුතු බව.

20අ. (1) අධ්‍යක්ෂවරයා විසින්, 20 (3) වන වගන්තිය යටතේ එක් එක් දිස්ත්‍රික්ක සමිතියේ සාමාජිකයන් බවට පත්වන, ඒ එක් එක් දිස්ත්‍රික්ක සමිතියේ සාමාජිකයන් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයෙහි පහත දැක්වෙන විස්තර ඇතුළත් විය යුතු ය :—

(අ) සාමාජිකයන්ගේ නම් සහ ලිපින ;

(ආ) වාහන අංකය ;

(ඇ) මාර්ග අංකය ;

(ඈ) බස්රථ ධාවන අවසර පත්‍රයේ සඳහන් මාර්ගයේ ආරම්භක ස්ථාන සහ අවසාන ස්ථානය ;

(ඉ) බස් රථ ධාවන අවසර පත්‍රය නිකුත් කරන ලද දිනය සහ අවසන්වන දිනය; සහ

(ඊ) දිස්ත්‍රික්ක සමිතිය කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වෙනත් සම් කාරණා.

(3) (1) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන සාමාජිකයන් පිළිබඳ ලේඛනයේ පිටපතක් සහ ඒ ලේඛනයට කලින් කල කරන ලද සංශෝධනවල පිටපතක් අධ්‍යක්ෂවරයා විසින් එක් එක් දිස්ත්‍රික්ක සමිතිය වෙත සැපයිය යුතු ය.

(4) 20 (3) වන වගන්තිය යටතේ දිස්ත්‍රික්ක සමිතියක සාමාජිකයකු වන සෑම තැනැත්තකු ම විසින්, තමා සාමාජිකයකු බවට පත්වීමෙන් දින දහතරක් ඇතුළත මේ පනතේ පළමුවන උප ලේඛනයෙහි සඳහන් ගාස්තු ඒ දිස්ත්‍රික්ක සමිතියට ගෙවිය යුතු ය.

(5) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් ගාස්තු ගෙවීම පැහැර හරින සෑම සාමාජිකයකු ම, සාමාජිකයකු වශයෙන් ස්වකීය අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට හෝ දිස්ත්‍රික්ක සමිතිය විසින් සලසනු ලබන පහසුකම් ප්‍රයෝජනයට ගැනීමට හෝ හිමිකම් නොලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "එක් වර්ෂයක්" යන වචන වෙනුවට, "තුන් වර්ෂයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(4) දිස්ත්‍රික්ක සමිතිය විසින් එහි ශුද්ධ ආදායමෙන්, මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති අනුප්‍රමාණ පදනම් කර ගෙන ගණන් ගනු ලබන මුදලක්, 23 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පෞද්ගලික බස්රථ ධාවකයන්ගේ සමිති සම්මේලනයට එහි මෙහෙයුම් කටයුතු සඳහා මුදල් සැපයීම හැකි කරවනු පිණිස, මාසිකව ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි " එක් වර්ෂයෙන් " යන වචන වෙනුවට " තුන් වර්ෂයක් " යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (2) දිස්ත්‍රික්ක සමිති සහ සමිති සම්මේලනය විසින්, ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී, අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය සහ විශේෂ විධාන යටතේ ක්‍රියා කළ යුතු ය. මේ බලය ක්‍රියාත්මක කිරීමේ දී, අධ්‍යක්ෂවරයා විසින් දෙනු ලබන විධානවල ස්වභාවය සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 27අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 27අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" නිලධාරීන් ඉවත් කිරීම, කාරක සභා විසුරුවා හැරීම ආදිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු බලතල.

27අ. (1) අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික්ක සමිතියේ කළමනාකාර කාරක සභාවේ හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාවේ සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරිකවරයා විසින් හෝ කිසියම් සාමාජිකයකු විසින් හෝ කළමනාකාර කාරක සභාවක් විසින් හෝ විධායක කාරක සභාව විසින් හෝ---

(අ) රැස්වීම් පැවැත්වීම හෝ රැස්වීම්වලට පැමිණීම හෝ පවත්වනු ලබන රැස්වීම්වල දී කටයුතු කිරීම නිරන්තරයෙන් ප්‍රතික්ෂේප කරනු ලබන බවට; හෝ

(ආ) මේ පනතින් නියම කර ඇති කාර්ය ඉටු කිරීම ඕනෑකමින් ම නොසලකා හරිනු ලබන බවට හෝ එහි ලා විෂමාචාරයෙහි යෙදෙන බවට ; හෝ

(ඇ) අධ්‍යක්ෂවරයාගේ විධානවලට හෝ නිර්දේශවලට නිරන්තරයෙන් අවනත නොවන බවට හෝ ඒ විධාන හෝ නිර්දේශ ගැන නිරන්තරයෙන් සැලකිල්ලක් නොදක්වන බවට; හෝ

(ඈ) අදක්ෂ ලෙස කටයුතු කරනු ලබන බවට සහ නොමනා ලෙස පාලනය කරනු ලබන බවට ; හෝ

(ඉ) මේ පනතින් පවරා ඇති බලතල අනිසි ලෙස ක්‍රියාත්මක කරනු ලබන බවට

ප්‍රමාණවත් සාක්ෂි ඇත්තේ යයි යම් වේලාවක අමාත්‍යවරයා සෑහීමට පත් වන්නේ නම්, අමාත්‍ය වරයා විසින් එක් එක් අවස්ථාවේ අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වන පරිදි, අධ්‍යක්ෂවරයාගේ උපදෙස් මත,—

(i) අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික්ක සමිතියක කළමනාකාර කාරක සභාවක හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාවේ සභාපතිවරයා, ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ධුරයෙන් ඉවත් කිරීම ; හෝ

(ii) අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික්ක සමිතියක කළමනාකාර කාරක සභාවක හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාවේ සියලුම සාමාජිකයන් හෝ ඔවුන් අතුරෙන් යම් සාමාජිකයකු හෝ ඉවත් කිරීම ; හෝ

(iii) අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්ක සමිතියක කළමනාකාර කාරක සභාවක් හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාව විසුරුවා හැරීම

කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, (1) (i) වන උප වගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි කළමනාකාර කාරක සභාවක හෝ විධායක කාරක සභාවේ සභාපතිවරයා, ලේකම්වරයා හෝ භාණ්ඩාගාරික වරයා හෝ (1) (ii) වන උපවගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි කළමනාකාර කාරක සභාවක හෝ විධායක කාරක සභාවේ සියලුම සාමාජිකයන් හෝ ඔවුන් අතුරෙන් යම් සාමාජිකයකු ඉවත් කරනු ලබන හෝ (1) (iii) වන උපවගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි කළමනාකාර කාරක සභාවක් හෝ විධායක කාරක සභාව විසුරුවා හරිනු ලබන අවස්ථාවක, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අලුත් ඡන්ද විමසීමක් පවත්වනු ලබන තෙක් හෝ අලුත් නම් කිරීමක් කරනු ලබන තෙක් හෝ අවස්ථාවෝචිත පරිදි අලුත් කළමනාකාර කාරක සභාවක් හෝ අලුත් විධායක කාරක සභාව තෝරා පත් කර ගනු ලබන තෙක් එසේ ඉවත් කරනු ලැබූ සභාපතිවරයාගේ, ලේකම්වර යාගේ හෝ භාණ්ඩාගාරිකවරයාගේ හෝ යම් සාමා ජිකයකුගේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා හෝ එසේ විසුරුවා හරිනු ලැබූ අවස්ථාවෝචිත පරිදි, කළමනා කාර කාරක සභාවක හෝ විධායක කාරක සභාවේ

බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා, වර්ෂයකට රුපියල් දහතුන් දහස් අටසියයකට නොඅඩු වැටුපක් ලබන, පෞද්ගලික බස්රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන ජ්‍යෙෂ්ඨ රජයේ නිලධරයකු පත් කරනු ලැබිය හැකි ය. අවස්ථාවෝචිත පරිදි, අලුත් කළමනාකාර කාරක සභාවක් හෝ විධායක කාරක සභාව හෝ තෝරා පත් කර ගැනීම හෝ එවැනි යම් කළමනාකාර කාරක සභාවක හෝ විධායක කාරක සභාවේ යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා වූ ඡන්ද විමසීම, අවස්ථාවෝචිත පරිදි, ඒ කාරක සභාව විසුරුවා හැරීමෙන් හෝ ඒ පුරප්පාඩුව ඇති වීමෙන් මාස හයක් ගත වීමට පෙර කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි "සහ මෝටර් වාහන කොමසාරිස්වරයා විමසීමෙන් පසු" යන වචන අස් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

28අ, 28ආ, 28ඇ, 28ඈ, 28ඉ, 28ඊ, 28උ සහ 28ඌ යන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති, එහි 28අ, 28ආ, 28ඇ, 28ඈ, 28ඉ, 28ඊ, 28උ සහ 28ඌ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"ගාස්තු අයකිරීමට ඇති බලය.

28අ. (1) පෞද්ගලික බස්රථවල තනි පාවිච්චිය පිණිස සලසා ඇති බස් නැවතුම් පොළක් පාවිච්චි කිරීම සඳහා පෞද්ගලික බස් රථයකින් පළාත් පාලන ආයතනයක් විසින් අය කරනු ලැබිය යුතු ගාස්තුව, අධ්‍යක්ෂවරයාගේ එකඟත්විය ඇතිව, ඒ පළාත් පාලන ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) දිස්ත්‍රික්ක සමිතියක් හෝ (1) වන උප වගන්තියෙහි සඳහන් පළාත් පාලන ආයතනයක් නොවන, කිසිම තැනැත්තකු හෝ සංවිධානයක් විසින්, නැවතුම් පොළ ගාස්තු, මගින් පටවා ගැනීමේ ගාස්තු හෝ ඒ හා සමාන ස්වභාවයක වෙනත් යම් ගාස්තුවක් හෝ අය කිරීමක් වශයෙන් යම් ගාස්තුවක් පෞද්ගලික බස් ධාවක යකුගෙන් ලබා ගැනීම හෝ අය කිරීම හෝ නොකළ යුතු ය.

(3) යම් පළාත් පාලන ආයතනයක් විසින් යම් පෞද්ගලික බස් ධාවකයකුට සපයන ලද යම් සේවාවක් සම්බන්ධයෙන් කෙළින්ම ඒ ධාවක ගෙන් යම් මුදලක් ඒ පළාත් පාලන ආයතනය විසින් අයකර ගනු නොලැබිය යුතු ය. ඒ ධාවක යාගෙන් ඒ පළාත් පාලන ආයතනයට අය විය යුතු සෑම මුදලක් ම ඔහු සාමාජිකයකු වන

දිස්ත්‍රික්ක සමිතිය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි ගෙවීමකට අදාළ යම් ගිවිසුමකට ඒ පළාත් පාලන ආයතනය හා ඒ දිස්ත්‍රික්ක සමිතිය ඇතුළත් විය යුතු ය.

ඡන්ද විමසීමේ කාර්ය සඳහා දිස්ත්‍රික්ක සමිතියක් හෝ සමිති සම්මේලනය සතු මුදල්, ස්ථාන, උපකරණ ආදිය පාවිච්චි කිරීම තහනම් බව.

28ආ. (1) අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ මුදල්, කාර්යාලීය ස්ථානය, කාර්ය මණ්ඩලය සහ උපකරණ, අවස්ථාවෝචිත පරිදි ඒ සමිතියේ කළමනාකාර කාරක සභාවේ හෝ ඒ සමිති සම්මේලනයේ විධායක කාරක සභාවේ ඡන්ද විමසීමක කාර්ය සඳහා කිසිම තැනැත්තකු විසින් පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ හේතුවෙන් මේ පනත යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තෙක් අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික්ක සමිතියකට හෝ සමිති සම්මේලන යට අවුරුදු පහක කාලයක් සඳහා තෝරා පත් කර ගනු ලැබීමට හෝ එහි යම් ධුරයක් දැරීමට හෝ නුසුදුස්සෙක් වන්නේ ය.

මුදල් සහ ආදායම බැංකු ගිණුමකට බැර කළ යුතු බව.

28ඇ. (1) දිස්ත්‍රික්ක සමිතියක සියලුම මුදල් සහ ආදායම හෝ 22 (4) වන වගන්තිය යටතේ සමිති සම්මේලනයට ගෙවනු ලබන මුදල, අධ්‍යක්ෂ වරයා විසින් අනුමත කරනු ලැබිය යුතු, බැංකුවක බැංකු ගිණුමකට බැර කරනු ලැබිය යුතු ය.

(2) ඒ එක් එක් ගිණුමට සහ ඒ එක් එක් ගිණුමෙන් මුදල් ගෙවීම, මේ පනත යටතේ වූ නියෝගවලින් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයකින්, කරනු ලැබිය යුතු ය.

විගණනය.

28ඈ. (1) අධ්‍යක්ෂවරයා විසින්, තත් කාර්යය සඳහා ලියවිල්ලකින් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් සෑම දිස්ත්‍රික්ක සමිතියක ම සහ සමිති සම්මේලනයේ ගිණුම් ලියවිල්ලකින් තමා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු ලවා සෑම ලිත් වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ විගණනය කිරීමට සැලැස්විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ විගණන යට, අවස්ථාවෝචිත පරිදි සෑම දිස්ත්‍රික්ක සමිති යකම හා සමිති සම්මේලනයේ වීතකාල ණය කිසි වක් වේ නම් ඒ වීතකාල ණය පිළිබඳ පරීක්ෂණ යක් සහ වත්කම් හා බැරකම් පිළිබඳ තක්සේරු කිරීමක් හා සත්‍යායනය කිරීමක් ද ඇතුළත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ විගණනයක කාර්ය සඳහා, අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ ගිණුම් විගණනය කිරීම පිණිස අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන ලද තැනැත්තාට—

(අ) අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ යම් අතීත හෝ වර්තමාන නිලධාරියකු, සේවා නියුක්තයකු හෝ සාමාජිකයකු හෝ ඒ ගිණුම් විගණනය කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන ලද තැනැත්තාගේ මතය අනුව, අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ යම් කටයුත්තක් පිළිබඳව හෝ එහි කටයුතුවල කළමනාකාරීත්වය පිළිබඳව වැදගත් තොරතුරු සැපයිය හැකි වෙනත් යම් තැනැත්තකු කැඳවීමට ;

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ කටයුතුවලට අදාළව තම භාරයෙහි හෝ සන්තකයෙහි ඇති යම් පොතක් හෝ ලේඛනයක් හෝ අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික් සමිතියට හෝ සමිති සම්මේලනයට අයත් තම භාරයෙහි හෝ සන්තකයෙහි ඇති යම් මුදලක්, සුරැකුම්පතක් හෝ වෙනත් දේපළක් ඉදිරිපත් කරන ලෙස අවස්ථාවෝචිත පරිදි ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ යම් අතීත හෝ වර්තමාන නිලධාරියකුට, සේවා නියුක්තයකුට හෝ සාමාජිකයකුට නියම කිරීමට ;

(ඇ) ඒ විගණනය කර ගෙන යනු ලබන අවස්ථාවේ දී ඒ බලය පවරන ලද තැනැත්තා විසින් යම් වංචාවක් සොයා ගනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික් සමිතියේ හෝ සමිති සම්මේලනයේ ගිණුම් පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමට

බලය තිබිය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ ගිණුම් විගණනය කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකුට අවස්ථාවෝචිත පරිදි ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ සියලු පොත්,

ගිණුම්, ලියවිලි සහ සුරැකුම්පත් සියලු කල්හි ලබා ගත හැකි විය යුතු අතර, ලඟ ඇති මුදල් පරීක්ෂා කර බැලීමේ හිමිකම ද තිබිය යුතු ය; තවද, අවස්ථාවෝචිත පරිදි ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ සියලු ගනුදෙනු සම්බන්ධයෙන් විගණනය කරන තැනැත්තාට අවශ්‍ය විය හැකි යම් තොරතුරක්, අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ සෑම නිලධරයකු හා සාමාජිකයකු විසින්, සපයනු ලැබිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ ගිණුම් විගණනය කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන ලද සෑම තැනැත්තකු ම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

විගණනයේ දී හෙළි වූ වෙනස්කම් කිසිවක් සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක සමිති හෝ සමිති සම්මේලනය වෙත දැනුම් දිය යුතු බව.

28ඉ. (1) අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ විගණන කටයුතු කර ගෙන යාමේ දී, වෙනස්කම් කිසිවක් සොයා ගනු ලැබුවහොත්, විගණනය පවත්වන තැනැත්තා විසින්, ඒ බව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු ය. අධ්‍යක්ෂවරයා විසින් ඒ වෙනස්කම් පිළිබඳව, අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතියට හෝ සමිති සම්මේලනයට දැනුම් දිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් නියමයක් කිරීමෙන්, අවස්ථාවෝචිත පරිදි, යම් දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ විගණන කටයුතු කර ගෙන යාමේ දී සොයා ගන්නා ලද වෙනස්කම් කිසිවකට ප්‍රතිකර්ම යෙදීම පිණිස ඒ නියමයෙහි සඳහන් කාලයක් ඇතුළත එහි සඳහන් යම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඒ දිස්ත්‍රික්ක සමිතියට හෝ ඒ සාමාජිකයන්ට නැතහොත් ඒ සමිති සම්මේලනයට හෝ එහි සාමාජිකයන්ට, විධාන කළ යුතු ය. ඒ නියමය කරනු ලැබූ සමිතිය හෝ සමිති සම්මේලනය හෝ සාමාජිකයා විසින්, ඒ අනුව ක්‍රියා කිරීම ඒ සමිතියේ හෝ සමිති සම්මේලනයේ හෝ සාමාජිකයාගේ යුතුකම විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ නියමයක් අනුව ක්‍රියා කිරීම, අවස්ථාවෝචිත පරිදි, යම් දිස්ත්‍රික්ක සමිතියක් හෝ සමිති සම්මේලනය විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, අවස්ථා වෝචිත පරිදි, ඒ සමිතියේ කළමනාකාර කාරක සභාවේ සෑම සාමාජිකයකු ම සහ ඒ සමිති සම්මේලනයේ විධායක කාරක සභාවේ සෑම සාමාජිකයකු ම විසින්—

(අ) අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ ගිණුම්වල නියමයේ සඳහන් පරිදි කිසිම වෙනස් කමක් නොමැති බව ; හෝ

(ආ) (2) වන උපවගන්තිය යටතේ වූ අධ්‍යක්ෂවරයාගේ නියමය අනුව ක්‍රියා කිරීම පිණිස තම බලය ඇතුළත සියලු පියවර ගෙන ඇති බව

අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් මිස, මේ වගන්තිය යටතේ වරදකට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

පරීක්ෂණය.

28ඊ. (1) අධ්‍යක්ෂවරයා විසින් අවස්ථා වෝචිත පරිදි යම් දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ කටයුතු, කර්තව්‍ය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳව සිය මෙහෙයීමෙන් ම පරීක්ෂණයක් පැවැත්වීම හෝ පවත්වන ලෙස තත් කාර්යය සඳහා ඔහු විසින් ලියවිල්ලකින් වූ නියමයකින් බලය පවරනු ලබන යම් තැනැත්තකුට විධාන කිරීම හෝ කළ හැකි ය. තවද, අධ්‍යක්ෂවරයා විසින් අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික් සමිතියක කළමනාකාර කාරක සභාවේ හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාවේ සාමාජිකයන් අතුරෙන් බහුතර සංඛ්‍යාවකගේ ඉල්ලීම පිට නැතහොත් ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ සාමාජිකයන් අතුරෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඉල්ලීම පිට හෝ අවස්ථා වෝචිත පරිදි ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ කටයුතු, කර්තව්‍ය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම හෝ පවත්වන ලෙස තත් කාර්යය සඳහා ඔහු විසින් ලියවිල්ලකින් වූ නියමයකින් බලය පවරනු ලබන යම් තැනැත්තකුට විධාන කිරීම හෝ කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ පරීක්ෂණයක කාර්යය සඳහා, අධ්‍යක්ෂවරයාට හෝ අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික් සමිතියක හෝ සමිති සම්මේලනයේ කටයුතු පිළිබඳ පරීක්ෂණයක් කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලබන යම් තැනැත්තකුට—

(අ) අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ යම් අතීත හෝ වර්තමාන නිලධාරියකු, සේවා නියුක්තයකු, සාමාජිකයකු, අධ්‍යක්ෂවරයාගේ හෝ ඒ පරීක්ෂණය පැවැත්වීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන ලද තැනැත්තාගේ මතය අනුව, අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ යම් කටයුත්තක් පිළිබඳව හෝ එහි කටයුතුවල කළමනාකාරිත්වය පිළිබඳව වැදගත් තොරතුරක් සැපයිය හැකි වෙනත් යම් තැනැත්තකු කැඳවීමට;

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ කටයුතුවලට අදාළව තම භාරයෙහි හෝ සන්තකයෙහි ඇති යම් පොතක් හෝ ලේඛනයක් හෝ අවස්ථාවෝචිත පරිදි ඒ දිස්ත්‍රික්ක සමිතියට හෝ සමිති සම්මේලනයට අයත් තම භාරයෙහි හෝ සන්තකයෙහි ඇති යම් මුදලක්, සුරැකුම් පතක් හෝ වෙනත් දේපළක් ඉදිරිපත් කරන ලෙස අවස්ථාවෝචිත පරිදි ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ යම් අතීත හෝ වර්තමාන නිලධාරියකුට, සේවා නියුක්තයකුට හෝ සාමාජිකයකුට නියම කිරීමට;

(ඇ) ඒ පරීක්ෂණයේ කාර්ය සඳහා කාරණා කිසිවක් නිසැකව දැන ගැනීම පිණිස ඔහු විසින් සඳහන් කරනු ලබන යම් වේලාවක සහ ස්ථානයක දී, අවස්ථාවෝචිත පරිදි ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ සමාජිකයන්ගේ මහා සභා රැස්වීමක් කැඳවීමට; සහ

(ඈ) ඒ පරීක්ෂණය කර ගෙන යනු ලබන අතරතුර, ඒ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් යම් වංචාවක් සොයා ගනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ ගිණුම් පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමට

බලය තිබිය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ කටයුතු පිළිබඳව මේ වගන්තිය යටතේ පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින්, ඒ පරීක්ෂණයේ ප්‍රතිඵලය අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතිය වෙත හෝ සමිති සම්මේලනය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා සහ මේ වගන්තිය යටතේ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බලය පවරනු ලැබූ සෑම තැනැත්තකු ම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

දිස්ත්‍රික්ක සමිතියක් හෝ සමිති සම්මේලනය විසින් ඇතැම් පොත්, වාර්තා ආදිය පවත්වා ගෙන යායුතු බව.

28උ. (1) සෑම දිස්ත්‍රික්ක සමිතියක්ම විසින්, එහි කර්තව්‍ය ඉටුකිරීමේ දී පහත දැක්වෙන පොත් සහ ලේඛන පවත්වා ගෙන යා යුතු ය :—

(අ) සාමාජික නාම ලේඛනයක් ;

(ආ) දිස්ත්‍රික්ක සමිතියේ රැස්වීම්වල වාර්තා පොතක් ;

(ඇ) කළමනාකාර කාරක සභාවේ රැස්වීම්වල වාර්තා පොතක් ;

(ඈ) මුදල් පොත සහ අදාළ ලේඛන ;

(ඉ) පොදු ලෙජරය ;

(ඊ) කාර්ය මණ්ඩල විස්තර, පත්වීම් ලිපි සහ වැටුප් විස්තර ; සහ

(උ) දිස්ත්‍රික්ක සමිතියේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වෙනත් ලේඛන.

(2) සමිති සම්මේලනය විසින්, එහි කර්තව්‍ය ඉටු කිරීමේ දී පහත දැක්වෙන පොත් සහ ලේඛන පවත්වා ගෙන යා යුතු ය :—

(අ) සමිති සම්මේලනයේ සාමාජික නාම ලේඛනයක් ;

(ආ) සමිති සම්මේලනයේ රැස්වීම්වල වාර්තා පොතක් ;

(ඇ) විධායක කාරක සභාවේ රැස්වීම්වල වාර්තා පොතක් ;

(ඇ) මුදල් පොත සහ අදාළ ලේඛන ;

(ඉ) පොදු ලෙජරය ;

(ඊ) කාර්ය මණ්ඩල විස්තර, පත්වීම් ලිපි සහ වැටුප් විස්තර ; සහ

(උ) සමිති සම්මේලනයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වෙනත් ලේඛන.

දිස්ත්‍රික්ක සමිතියක කළමනාකාර කාරක සභාව හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාව විසුරුවා හැරීම.

28ඌ. (1) අවස්ථාවෝචිත පරිදි, යම් දිස්ත්‍රික්ක සමිතියක කළමනාකාර කාරක සභාව හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාව විසින් ස්වකීය කර්තව්‍ය නිසි පරිදි ඉටු කරනු නොලබන බව 28ඊ වන වගන්තිය යටතේ කරන ලද පරීක්ෂණයකින් පසු අධ්‍යක්ෂවරයාගේ මතය වන්නේ නම්, ඒ යම් සභාවක් විසුරුවා හැරීම සම්බන්ධයෙන් එහි විරෝධතා කිසිවක් ඇතොත් ඒ විරෝධතා ප්‍රකාශ කිරීමට ඒ යම් සභාවකට අවස්ථාවක් දීමෙන් පසු සහ ලියවිල්ලකින් වූ නියමයක් මඟින් අධ්‍යක්ෂවරයා විසින් කැඳවනු ලබන, අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ මහා සභා රැස්වීමක දී ඒ විරෝධතා සලකා බැලීමෙන් පසුව, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධ්‍යක්ෂවරයා විසින්—

(අ) අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතියේ කළමනාකාර කාරක සභාව හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාව විසුරුවා හැරිය හැකි ය ;

(ආ) අලුත් කාරක සභා තෝරා පත්කර ගනු ලබන තෙක් අවස්ථාවෝචිත පරිදි, ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ කටයුතු මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් පත් කරනු ලබන සුදුසු තැනැත්තකු හෝ තැනැත්තන් විසින් කළමනාකරණය කළ යුතු බවට සහ පරිපාලනය කළ යුතු බවට විධාන කළ හැකි ය. ඒ කාලසීමාව මාස හයක් නොඉක්මවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින්, ඒ නියමය හෝ තදනන්තර නියමයක් මගින් අවස්ථාවෝචිත පරිදි ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ කටයුතු කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම සඳහා, නිසි හා සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් කලින් කල ඉවත් කිරීම හෝ ඒ තැනැත්තා හෝ තැනැත්තන් වෙනුවට වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් පත් කිරීම හෝ අතිරේක තැනැත්තන් පත්කිරීම හෝ කළ හැකි ය.

(3) අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් ව අවස්ථාවෝචිත පරිදි, යම් දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ කටයුතු කළමනාකරණය කිරීම පිණිස මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකුට—

(අ) අවස්ථාවෝචිත පරිදි ඒ දිස්ත්‍රික්ක සමිතියේ හෝ සමිති සම්මේලනයේ වත්කම් අයකර ගැනීමේ හා බැරකම් නිදහස් කිරීමේ සහ එහි යහපත සඳහා අවශ්‍ය වෙනත් යම් පියවර ගැනීමේ බලය තිබිය යුතු ය ; තව ද

(ආ) අවස්ථාවෝචිත පරිදි ඒ දිස්ත්‍රික්ක සමිතියේ යථා පරිදි සංස්ථාපනය කරන ලද කළමනාකාර කාරක සභාවක් හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාව සතු සියලු බලතල, අයිතිවාසිකම් සහ වර ප්‍රසාද ක්‍රියාත්මක කළ හැකි ය.

(4) අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් පත්කරන ලද යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය අධ්‍යක්ෂවරයා විසින් නියම කළ හැකි ය. ඒ පාරිශ්‍රමිකය සහ අවස්ථාවෝචිත පරිදි දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ කළමනාකරණය සඳහා දරන ලද වෙනත් වියදම් කිසිවක් වෙතොත්, ඒ වියදම් එහි අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ විධානය බලාත්මක වීම අවසාන වන දිනයට පෙරාතුව, අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව අලුත් කාරක සභා පත් කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම, අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ කටයුතු කළමනාකරණය සඳහා මේ පනත යටතේ පත් කරනු ලැබුවා වූ ද ඉහත කී දිනයට පෙරාතුවම ධුර දරන්නා වූ ද තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ කාර්යය විය යුතු ය.

(6) (අ) අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්ක සමිතියක කළමනාකාර කාරක සභාවක් හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාව (1) වන උපවගන්තිය යටතේ විසුරුවා හරිනු ලැබ ඇති අවස්ථාවක, ඒ කළමනාකාර කාරක සභාව විසින් හෝ ඒ කාරක සභාවේ සාමාජිකයකු විසින් හෝ විධායක කාරක සභාව විසින් හෝ ඒ කාරක සභාවේ සාමාජිකයකු විසින් ඒ නියමයට විරුද්ධව, නියමයේ දින සිට මාස දෙකක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ ලියාපදිංචි කිරීම අවලංගු කරමින් නියමයක් කරනු ලැබීමෙන් මාස දෙකක් ඇතුළත කිසිම අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, ඒ කාලය ඉකුත් වූ විට නියමය බලාත්මක විය යුතු ය. මාස දෙකක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, නියමය අභියාචනයේ දී ස්ථිර කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 31අ සහ 31ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එහි 31අ සහ 31ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"මේ පනත යටතේ වූ වැරදි සංඥේය වැරදි විය යුතු බව.

31අ. (1) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පළමුවන උපලේඛනයෙහි පට හැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ වූ සෑම වරදක් ම සංඥේය වරදක් විය යුතු ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් සාම නිලධරයකු වෙත පවරා ඇති යම් බලයක්, මේ පනතේ කාර්ය සඳහා ක්‍රියාත්මක කිරීම පිණිස, අධ්‍යක්ෂවරයා සහ 2(3) වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු, එකී පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

ස්ථානික දඩ ගෙවීමට නියම කිරීම.

31ආ. අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු හෝ පොලිස් නිලධරයකු විසින් මේ පනතේ විධිවිධාන කිසිවක් කඩකර ඇති ලෙස සොයා ගනු ලැබීමේ දී ඒ කඩ කිරීම පිළිබඳ වගකීම පිළිගනු ලබන යම් තැනැත්තකු විසින්, තමා වගකීම පිළිගෙන ඇති වරද සම්බන්ධයෙන්, මේ පනතේ තුන්වන උපලේඛනයෙහි දක්වා ඇති දඩ මුදල, ඒ වරද සඳහා නඩු පැවරීම වෙනුවට, ගෙවනු ලැබිය හැකි ය. ඒ ගෙවීම යම් කච්චේරියක දී හෝ තැපැල් කාර්යාලයක දී කරනු ලැබිය හැකි අතර, ඒ ගෙවීම කරනු ලැබූ බවට සාක්ෂි වශයෙන් වූ ලදුපත, ඒ සොයා ගැනීමෙන් පසු සති දෙකක් ඇතුළත, පෞද්ගලික බස්රථ ගමනාගමන දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක කිරීමේ නිලධරයා වෙත හෝ සොයා ගැනීම කරනු ලැබූ පොලිස් නිලධරයා විසින් නම් කරනු ලැබූ පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිවරයා වෙත හෝ පෞද්ගලිකව භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ "නියමිත" යන අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'"මාර්ගය" යන්නෙන්, බස්රථ ධාවන අවසර පත්‍රයේ සඳහන් මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වූ සම්පූර්ණ මාර්ගය අදහස් වේ.'.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපලේඛන මෙයින් ඇතුළත් කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛන ඇතුළත් කිරීම.

[20අ(4) වන වගන්තිය]

"පළමුවන උපලේඛනය

දිස්ත්‍රික්ක සමිතියට ගෙවනු ලැබිය යුතු ගාස්තු :

| | රු. |
|---|---|
| එක් එක් සාමාජිකයාගෙන් එක් වර්ෂයකට ... | 100 ක් |
| ධාවනය කරනු ලබන එක් එක් බස් රථයෙන් එක් මාසයකට... | 300ක් |

[22(4) වන වගන්තිය]

දෙවන උපලේඛනය

දිස්ත්‍රික්ක සමිති විසින් සමිති සම්මේලනය වෙත කළයුතු ගෙවීම :

| | රු. |
|---|---|
| බස් රථ 100 කට අඩු දිස්ත්‍රික්ක සමිතියක් මාසයකට | 500 ක් |
| අවම වශයෙන් බස් රථ 100 සිට 500 දක්වා ඇති දිස්ත්‍රික්ක සමිතියක් මාසයකට ... ... | 1,000 ක් |
| අවම වශයෙන් බස් රථ 500 සිට 1000 දක්වා ඇති දිස්ත්‍රික්ක සමිතියක් මාසයකට ... ... | 2,500 ක් |
| අවම වශයෙන් බස් රථ 1000 කට වැඩියෙන් ඇති දිස්ත්‍රික්ක සමිතියක් මාසයකට ... ... | 5,000 ක් |

[31ආ වගන්තිය]

තුන්වන උපලේඛනය

| | රු. |
|---|---|
| පළමුවන වරට කරන ලද වරද සම්බන්ධයෙන් ස්ථානික දඩය ... | 250 ක් |
| දෙවන වරට සහ තදනන්තරව කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් ස්ථානික දඩය ... ... ... | 500 ක්.". |